ද මැසනොද් විදුහල, කඳාන
De Mazonod College, Kandana

28 . 11 . 2016

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පළමු වාර පරීක්ෂණය
General Certificate of Education (Advanced Level) Examination - 1st Term Test

| | | |
|---|---|---|
| පෙරදිග සංගීතය I<br>Eastern Music I | 12 ශ්‍රේණිය<br>Grade 12 | කාලය<br>පැය පැයයි |

සැ.යු. ✷සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

✷දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම යෝග්‍ය පිළිතුර තෝරන්න.

01. දීර්ඝ ශ්වසනය පුහුණු වීම සඳහා පන්ති කාමරය තුළ දී ඔබ විසින් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකමක් වන්නේ,
    (1) තාම්පුරාවේ ශ්‍රැතියට "ස" ස්වරය ගායනය කිරීම.
    (2) දැල්වූ ඉටිපන්දම් දැල්ලට ඒකාකාරීව පිඹීමෙන් එය නොනිමෙන සේ දීර්ඝ වේලාවක් පවත්වාගෙන සිටීම.
    (3) අනාඝාත්මක පැදියක් ගායනය කිරීම.
    (4) පුළුන් කැබැල්ලකට නැවත නැවත පිඹිමින් ගුවනේ රඳවා ගැනීම.
    (5) ගුලිකරගත් කුඩා කොළ කැබැල්ලක් මේසය මතින් බිමට නොවැටෙන සේ පිඹීම.

02. එකම ස්වරයක් මත පිහිටා ගායනය කිරීමට වඩාත් සුදුසු වන්නේ,
    (1) ඒ භාග්‍යවතුන් වහන්සේ............
    (2) ඕම් සහනා භවතු...............
    (3) ඕම් නම ශිවාය.............
    (4) යාකුන් දේන්ද්‍ර තුෂාර.............
    (5) යෝවද තම්පව.................           වශයෙන් වූ ගායනයයි

03. උච්ච සප්තකයේ ස්වර ගායනය කිරීමට අපහසු සිසුවෙකුට පහසුවෙන් ගායන කිරීමට වඩාත් සුදුසු ශ්‍රැති ස්වරය වන්නේ,
    (1) ස, රි    (2) ස, ග    (3) නි, ස    (4) ධ, නි    (5) ම, ප

04. සංගීත විෂයට ආධුනික සිසුවෙකුට පහසුවෙන් ස්වර ගායන කුසලතාවය දියුණු කර ගැනීමට වඩාත් සුදුසු ස්වර අභ්‍යාසය වන්නේ,
    (1) ප ධ ප, ප ධ නි ධ ප
    (2) සරි ගරි සරි ගම, රිග මග රිග මප
    (3) සරිග, රි ග ම
    (4) ග රි ස රි ග, ම ග රි ග ම
    (5) සගරිස, රිමගරි, ගපමග, මධපම

05. පද මාලාවෙන් නිරූපණය වන අර්ථය භාවමය ගීතයක් බවට පෙරළීමට කටහඬ පාලනය නම් ශිල්ප ක්‍රමය ඖචිත්‍යකින් යුතුව භාවිතයට ගත් අවස්ථාවක් සඳහා උදාහරණයක් වන්නේ,
    (1) නෙලන්නට ගිහින් පලවැල ගෙනයන්නේය ගීතය
    (2) දූල් සල්වනේ කල් ගීතය
    (3) නොකියාම එදා ඇසල මහේ ගීතය
    (4) ගල්ලෙන බිඳලා ගීතය
    (5) ගායෙන් මා මුදවාලා ගීතය

12

28 · 11 · 2016

06. මා සොඳුර.... මා සොඳුර..... මා ප්‍රිය දියණිය..... මෙම නාට්‍ය ගීතය ඇතුළත් නාට්‍යයේ නම හා නාට්‍ය නිෂ්පාදකවරයා වන්නේ,

(1) සිංහබාහු, මාහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
(2) සිංහබාහු, ලූෂන් බුලත්සිංහල මහතා
(3) කුවේණි, හෙන්රි ජයසේන මහතා
(4) මනමේ, මාහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
(5) නරි බෑණා, දයානන්ද ගුණවර්ධන මහතා

Learning Resource Center
R
De Mazenod College
Kandana

07. රාගධාරී ගීතයක් ගායනා කිරීමේදී නිවැරදි ඉරියව්වක් වන්නේ,

(1) ස්වරාලයේ ක්‍රියාකාරිත්වය අවහිර නොවන සේ මුහුණ කෙලින් තබා ගායනය
(2) පිටකොන්ද තමාට රිසිසේ තබාගෙන ගායනය
(3) මානසික ඒකාග්‍රතාවයකින් තොරව ගායනය
(4) ඕනෑම පහසු ඉරියව්වෙන් අසුන් ගෙන ගායනය
(5) නැගී සිට රාගය ගායනය කිරීම

08. එක් ස්වරයක් සිට තවත් ස්වරයක් දක්වා නොකඩවා නාදය ගලා යෑමේ ශිල්පීය ක්‍රමය හඳුන්වන පාරිභාෂික වචනය වන්නේ,

(1) ගමක් (2) මූර්කි (3) ඛන් (4) මීන්ඩ් (5) ආන්දෝලන

09. ම, ස වාදී සංවාදී වන සාපි මේලගත රාග යුගලයකි,

(1) භාගේශ්‍රී - දේශ්
(2) දේශ් - තිලක්කාමෝද්
(3) භාගේශ්‍රී - භිම්පලාශ්‍රී
(4) බිහාග් - භිම්පලාශ්‍රී
(5) ජයජයවන්ති - භාගේශ්‍රී

10. රාග විස්තර ඇතුළත් කොට නිර්මාණය කර ඇති ගීත විශේෂය හඳුන්වන්නේ මෙම නමිනි,

(1) සර්ගම් ගීත
(2) මධ්‍යලය ගීත
(3) විලම්භලය ගීත
(4) ලක්ෂණ ගීත
(5) ඛ්‍යාල් ගීත

11. තාලාත්මක වූත් රාගාත්මක වූත් අර්ථ රසයෙන් තොරවූත් ගීත විශේෂය,

(1) සර්ගම් ගීත
(2) මධ්‍යලය ගීත
(3) විලම්භලය ගීත
(4) ලක්ෂණ ගීත
(5) ඛ්‍යාල් ගීත

12. "නීරභරන කෙසෙ ජාංලං" යන මධ්‍යලය ගීත අයත් වන රාගයේ නම කුමක්ද?

(1) බිහාග්
(2) භාගේශ්‍රී
(3) තිලක්කාමෝද්
(4) දේශ්
(5) ජයජයවන්ති

13. ශාස්ත්‍රීය සංගීතයේදී රාගයට ප්‍රවිෂ්ට වීම සඳහා යොදා ගනු ලබන ගායන/ වාදන අංගයකි,

(1) ආලාප
(2) ගමක්
(3) තානාලංකාර
(4) මීන්ඩ්
(5) දොහොරාව

14. රාගයන්ගේ රස නිෂ්පත්තිය සඳහා ඇතැම් ස්වරයක් තවත් ස්වරයක අල්ප වශයෙන් ස්පර්ශ කිරීම හඳුන්වන්නේ,

(1) ගමක්
(2) මූර්ති
(3) තිහායි
(4) මීන්ඩ්
(5) ඛන්

15. ශාස්ත්‍රීය සංගීතයේදී මූර්කි ස්වර ලියා දක්වන්නේ මෙලෙසිනි,

(1) ග ස
(2) $^{රි}$ග , $^{ම}$ප
(3) (ස) , (ප)
(4) ගමරිස
(5) ගගරි ගගරි ගගරිස

16. මාත්‍රා 3, 4 වශයෙන් ගොඩනැගෙන තිත් රූපය වන්නේ,

(1) මැදුම් මහ දෙතිත
(2) සුළු මැදුම් දෙතිත
(3) සුළු මහ දෙතිත
(4) දෙසුළු මැදුම් තුන් තිත
(5) මැදුම් මහ තුන් තිත

17. 3/4 හා 4/4 යන බටහිර තාලවලට සමාන වන හින්දුස්ථානී තාල පිළිවෙළින්,

(1) දීප්චන්දි හා ත්‍රිතාලය
(2) දාදරා හා ජප්තාල්
(3) ත්‍රිතාලය හා දාදරා
(4) දාදරා හා ත්‍රිතාලය
(5) කෙහෙර්වා හා ත්‍රිතාලය

18. කර්ණාටක සංගීත පද්ධතියට අයත් ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයකි,

(1) පක්වාජ්
(2) තබ්ලා
(3) ඩෝලක්
(4) මෘදංග
(5) ඩෝල්කි

19. බටහිර සංගීත පද්ධතියේ මූලික සංගීත සිද්ධාන්තයයි,

(1) මෙලඩි
(2) හාර්මනි
(3) කෝඩ්ස්
(4) කවුන්ටර් පොයින්ට්
(5) ඇඩ්ලිබ්

20. දෙසුළු මැදුම් තුන් තිත පිළිඹිබු වන සංඛ්‍යා රටාව වන්නේ,

(1) /12/12/1234/
(2) /12/123/1234/
(3) /12/123/123/
(4) /12/12/123/
(5) /123/123/1234/

ද මැසනොද් විදුහල, කඳාන
De Mazonod College, Kandana

28. 11. 2016

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පළමු වාර පරීක්ෂණය
General Certificate of Education (Advanced Level) Examination - 1st Term Test

| | | |
|---|---|---|
| පෙරදිග සංගීතය II<br>Eastern Music II | 12 ශ්‍රේණිය<br>Grade 12 | කාලය<br>පැය දෙකයි |

Learning Resource Center
R
De Mazenod College
Kandana

සැ.යු. ✳ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ඔබ කැමති රාගයක මධ්‍යලය ගීයක් ප්‍රස්තාර කරන්න.
    (ii) එයට ආලාප බන්ධයක් නිර්මාණය කරන්න.
    (iii) එයට තානාලංකාර 3ක් නිර්මාණය කරන්න.

02. (i) භාගේශ්‍රී රාගයේ මධ්‍යලය ගීයක් ප්‍රස්තාරය කරන්න.
    (ii) එයට ආලාප බන්ධයක් නිර්මාණය කරන්න.
    (iii) එයට තානාලංකාර 3ක් නිර්මාණය කරන්න.

03. (i) ඔබ කැමති සර්ගම් ගීයක් ප්‍රස්තාර කරන්න.
    (ii) ඔබ කැමති ලක්ෂණ ගීයක් ප්‍රස්තාර කරන්න.

04. (i) තානාලංකාර යන්න නිර්වචනය කරන්න.
    (ii) තාන වර්ග 4ක් නම් කරන්න.
    (iii) තාන වර්ග 2ක් උදාහරණ දෙමින් විස්තර කරන්න.
    (iv) ආලාප යන්න නිර්වචනය කරන්න.
    (v) ආලාප වර්ග 2ක් නම් කරන්න.
    (vi) එම ආලාප වර්ග දෙක උදාහරණ දෙමින් විස්තර කරන්න.

05. (i) දේශීය තාල පද්ධතිය හඳුන්වන්න.
    (ii) තනි තිතෙහි හා දෙතිතෙහි ප්‍රභේදවලට අදාළ බෙර පද ප්‍රස්ථාර කරන්න.
    (iii) තුන් තිතෙහි හා සිව් තිතෙහි ප්‍රභේද සංඛ්‍යාත්මක ව දක්වන්න.

06. (i) ගති, මිති, ලය යන සංකල්ප නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
    ◆ පහත සඳහන් තාල ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    A: දාදරා B: ත්‍රිතාල්
    C: ජප්තාල් D: දීප්චන්දි
    (i) A හා B යන තාල දෙක සම විෂමතා දක්වමින් සන්සන්දනය කරන්න.
    (ii) C හා D තාල මත නිර්මාණය වී ඇති ගී පාද දෙක බැගින් උදාහරණ සපයන්න.
    (iii) C තාලය නියමිත තාල සංකේත යොදමින් සම දෙගුණ වශයෙන් ප්‍රස්ථාර කරන්න.

07. (i) තබ්ලාවක රූපසටහනක් ඇඳ කොටස් නම් කරන්න.
    (ii) තබ්ලාවේ දායාවෙන් හා බායාවෙන් උපදින අක්ෂර වෙන් වෙන්ව දක්වන්න.
    (iii) රූප සටහනක් මඟින් පහත සඳහන් අක්ෂර උපදින ස්ථාන දක්වන්න. (ති, න, කත්, ගෙ)
    (iv) ඔබ උගත් කායාදාවක් ලියා දක්වන්න.